රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Provincial Councils and Local Government

ස්වදේශ කටයුතු අංශය
உள்நாட்டலுவல்கள் பிரிவு
Home Affairs Division

"නිල මැදුර", ඇල්විටිගල මාවත, කොළඹ 05.
"நில மெதுர", எல்விடிகல மாவத்தை, கொழும்பு 05
"Nila Madura", Elvitigala Mawatha, Colombo 05.

TP : +94 112 050 450
Fax : +94 112 369 971
Email: info@moha.gov.lk
Web : www.moha.gov.lk

මගේ අංකය / எனது இல / My No } HA/3/7/28-7 | ඔබේ අංකය / உமது இல / Your No } | දිනය / திகதி / Date } 2026.10. 23

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්,
සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්,

**පරිපාලන ග්‍රාම නිලධාරි සහ ග්‍රාම නිලධාරි වාර්ෂික ස්ථාන මාරු නියෝග - 2027 සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අභියාචනා වලට අදාළ තීරණ දැනුම් දීම**

2027 වාර්ෂික ස්ථාන මාරු නියෝග වලට එරෙහිව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා වලට අදාළව අමාත්‍යාංශ ස්ථාන මාරු අභියාචනා මණ්ඩලය විසින් ලබා දී ඇති නිර්දේශ මගේ අනුමැතිය සහිතව ඇමුණුම I පරිදි ඔබ වෙත ඉදිරිපත් කරමි.

02. ඒ අනුව, මෙම අභියාචනා මණ්ඩල තීරණ ද සැලකිල්ලට ගෙන මගේ සමාංක හා 2026.09.17 සහ 2026.09.24 දිනැති ලිපි මගින් දැනුම් දෙන ලද ස්ථාන මාරු වීම් පහත සඳහන් ආකාරයට ක්‍රියාත්මක විය යුතුය. මේ බව ඔබ කාර්යාලයේ අදාළ නිලධරයන් වෙත දන්වා නියමිත දිනයේදී නව සේවා ස්ථානයේ වැඩ භාර ගන්නා ලෙස ඔවුන්ට දැනුම් දෙන ලෙස කාරුණිකව දන්වමි.

I. ග්‍රාම නිලධාරි ස්ථාන මාරු -
II. පරිපාලන ග්‍රාම නිලධාරි ස්ථාන මාරු -

} නම ඉදිරියෙන් ක්‍රියාත්මක වන දිනය සඳහන් කර ඇති නිලධාරීන් එම දිනයේදී සිට ද අනෙකුත් සියළුම නිලධාරීන්ගේ ස්ථාන මාරු 2027.01.01 දින සිට ද ක්‍රියාත්මක වේ.

03. අදාළ නිලධරයන් නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන සේ නියමිත දිනට වර්තමාන සේවා ස්ථානයෙන් මුදා හැරීමට කටයුතු කරන ලෙස දන්වන අතර, මෙම ස්ථාන මාරු වීම් ප්‍රමාදයෙන් තොරව අදාළ දිනයන්ට ක්‍රියාත්මක කළයුතු බව ද දන්වමි. **තවද ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස අතර ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී මගේ අංක HA/3/2/5-3 වෙළුම II හා 2026.06.30 දිනැති ලිපියට වැඩිමනක් වශයෙන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයන්හි පවතින පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් සිදු කරන ලද නිලධාරීන් අනුයුක්ත කිරීමට බාධාවක් නොවිය යුතුය.**

04. තවද මෙම නියෝග වලට එරෙහිව යම් නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII වන පරිච්ඡේදයේ 256 වගන්තියට අනුකූලව පමණක් ඉදිරිපත් කළ යුතු අතර ඒවා 2027.11.10 දිනට පෙර ප්‍රාදේශිය ලේකම් සහ දිස්ත්‍රික් ලේකම් මගින් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

05. වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව සිදු කරන මෙම ස්ථාන මාරු වීම් සඳහා ගමන් වියදම් හෝ උපවේශන දීමනා ගෙවනු නොලබන බව වැඩිදුරටත් දන්වමි.

ඩී.ඩී.සී.අතුකෝරළ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
(ග්‍රාම නිලධාරි පාලන)

අත්/කළේ:- එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය